# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශයේ ප්‍රකාශනයකි

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි

**තාක්ෂණික පත්‍රිකා අංක 03**

---

## පේර වගාවේ ගෙඩි සඳහා වැළඳෙන රෝග පාලනය

පේර (*Psidium guajava* L) ගෙවතු වගාවේදී මෙන්ම වාණිජව වගා කරනු ලබන ආර්ථික වශයෙන් වැදගත් පළතුරකි. ප්‍රධාන වශයෙන් අළුත් පළතුරක් ලෙස භාවිතා කරනු ලබන නිසා පේර ගෙඩි වලට දිලීර රෝග ආසාදනය වු විට වෙළඳපොළේදි හොඳ මිලක් ලබා ගැනිමට අපහසු වේ. පේර ගෙඩි සඳහා ප්‍රධාන දිලීර රෝග හතරක් (4) ආසාදනය වේ. මේ නිසා විශේෂයෙන් තෙත් හා අන්තර්මාධ්‍ය කලාප වල ගෙවතු පේර වගාවලද අස්වැන්න ලබා ගත නොහැකි තත්ත්වයට පත් වන අවස්ථා සුලබය. වගා සුපරික්ෂාව තුළින් රෝග හඳුනා ගැනිමත්, ඒකාබද්ධ පාලන ක්‍රම මඟින් රෝග පාලනය කිරිමත් කළ හැක.

### 1. මලාග්‍ර කුණුවීම Styler end rot — රෝග බාරකයා -*Phomopsis psidi*

**රෝග ලක්ෂණ**

- ලපටි ඵල මෙන්ම පරිනත ගෙඩිද මෙම ආසාදනයට ලක් විය හැක.
- නටුවට විරුද්ධ පැත්තෙන් ආසාදනය ආරම්භ වී ගෙඩියේ පහළ කොටස වටා තද කළු තිත් රවුමක් /වලල්ලක් සේ මතුවී පසුව ඒවා එකිනෙකට සම්බන්ධ වී සම්පූර්ණයෙන් කළු පැහැ ගැන් වී යයි.
- පසුව ගෙඩියේ ඇතුළත කොටස්ද කුණු වී යයි.
- ගෙඩියේ මතුපිට ආසාදිත කොටසේ හට ගන්නා බීජාණු මඟින් (කළු පැහැති කුඩා පික්නිඩියා) රෝගය පැතිරේ.

### 2. ගෙඩි කබොළු රෝගය Scab Disease — රෝග කාරකයා *Pestalotia psidi*

**රෝග ලක්ෂණ**

- දුඹුරු පැහැති කබොළු ගෙඩි මත ඇතිවන අතර, මෙම කබොළු විශාලවීමේදි ගෙඩියේ තැනින් තැන පැලීම සිදුවේ
- පැලීම් නිසා වෙනත් දිලීරයන්ගේ ද්විතියික ආසාදනය නිසා ගෙඩි කළු පැහැ වී වේගයෙන් කුණු වේ.
- දිලීරය ආසාදනය වන්නේ ,හෙලොපෙල්ටිස් ඇන්ටෝනි.. නැමැති කෘමියා විසින් ගෙඩියේ යුෂ උරා බොන ලද ස්ථාන වලිනි. මෙයට අමතරව අග්‍රස්ත අංකුර, ලපටි පත්‍ර හා මල් පොහොට්ටු වලට හානි කළවිට එම ස්ථාන කළු පැහැ වී වියළී යයි.

### 3. ඇන්ත්‍රැක්නෝස් Anthracnose — රෝග කාරකයා *Colletotrichum gloeosporioides*

**රෝග ලක්ෂණ**

- බොහෝ විට වර්ෂා කාලයේදි නොපැසුණු ගෙඩි මත අල්පෙනේති තිත් තරම් ලප හට ගනී. එම ලප ක්‍රමයෙන් විශාල වී තද ගතියෙන් යුක්ත ඇතුළට ගිලුණු රවුම් ආකාර දුඹුරු පැහැ පැල්ලම් දක්නට ලැබේ.
- පසුව ආසාදිත පේර ගෙඩි සම්පූර්ණයෙන් කලු පැහැයට හැරේ.
- මල් හා අතු වලට රෝගය ආසාදනය වු විට අතු ඉහල සිට පහලට මිය යාම සිදු විය හැකි අතර අවසානයේදි ශාඛයම මිය යයි.

### 4. මෘදු කුණුවීම Soft rot — රෝග කාරකයා *Botrydiplodia theobromae*

**රෝග ලක්ෂණ**

- ඉදුණු හා ඉදිමට ආසන්න ගෙඩි වලට ආසාදනය වේ
- ලා හෝ තද දුඹුරු මෘදුවන් කුණු විම ගෙඩිය පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමක් සිදු වේ
- තෙත් කාලගුණයකදි කුණුවු ස්ථාන වල මතුපිට අළු පැහැති දිලීර ජාලයක් දක්නට ලැබේ.

## රෝග පාලනය

මෙම සියළු රෝග සඳහා ඒකාබද්ධ ක්‍රමවේදයෙන් පොදුවේ අනුගමනය කිරිම තුළින් මෙම ආසාදනය පැතිරීම පාලනය කර ගත හැකි වේ.

- ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම

1- පේර ගස් සිටුවීම සඳහා හොඳින් ජලය බැස යන, ආලෝකය හොඳින් ලැබෙන ස්ථානයක් තෝරා ගත යුතුය.
2- නිසි පරතරයට සිටුවීම - (පරතරය - මි. 5-6 x 5-6 ක)
3- හැකි සෑම අවස්ථාවකම හොඳින් දිරාපත් වු ගොම/ කොම්පෝස්ට්, කාබනික පොහොර යෙදීම.
4- නිර්දේශිත ආකාරයට හා ප්‍රමාණයට රසායනික පොහොර යෙදීම.

- වගා නඩත්තුව හා සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කිරිම

5- අතු මතට හොඳින් හිරු එළිය වැටෙන සේ නිර්දේශිත පුහුණු කිරිම හා කප්පාදු කිරිමේ ක්‍රම වගාව ආරම්භයේ සිටම අනුගමනය කිරිම.
6- ඵල තුනි කිරිම.
7- වගාව තුළ හා අවට පිරිසිදුව තබා ගැනිම.
8- ආසාදිත ගෙඩි සහ අතු රිකිලි ඉවත් කිරිම.
9- අවට වගාවන් පිළිබඳ සුපරීක්ෂාවෙන් සිටිම මඟින් දිලීර ආසාදන තත්ත්ව කල් තියා හඳුනා ගැනිම හා පෙර කන්න වලදී අත්දැකිම් අනුව එසේ අවදානමක් ඇත්නම් මල් හට ගන්නා අවස්ථාවේදිම ආරක්ෂිත දිලීර නාශක යෙදිම.
10- ආර්ද්‍රතාවය වැඩි තෙත් කාලගුණයකදි දිලීර රෝග ආසාදනය වැඩි බැවින් අවධානයෙන්, සිට ආරක්ෂිත දිලීර නාශක යෙදිම.
11- අස්වනු නෙලිමෙන් පසු එම ශාඛාවේ පත්‍ර යුගල 2-3 ක් ඉවත් වන සේ කප්පාදු කිරිම.

- දිලීර නාශක භාවිතය

1- ගෙවතු වගාවන් සඳහා පරිසර හිතකාමි ක්‍රම ලෙස ශාඛ සාර භාවිතය
   - කුරුඳු කොළ නිස්සාරක භාවිතය -කුරුඳු කොළ ග්‍රෑම් 250 ක් අඹරා එයට ජලය ලිටර එකක් මිශ්‍රකර පෙරා එම සාරය ඉසීම සඳහා භාවිතා කෙරේ.
   - කොහොඹ බීජ නිස්සාරකය -ඇන්ත්‍රැක්නෝස් හා කබොළු රෝගය හොඳින් පාලනය වේ.
2- මැන්කොසෙබ්, ඩැකොනිල්, මැනේබ් වැනි දිලීර නාශක නිර්දේශ කර ඇත.දිලීර නාශක යෙදිමේදි දින 14 කට වැඩි පෙර අස්වනු කාලයක් තිබිය යුතුය.
3- වාණිජ වගාවක ආසාදන තත්ත්ව යටතේදි ආසාදිත ගෙඩි හා මේරු ඵල ඉක්මනින් ඉවත් කොට, කුඩා ගෙඩි වලට දිලීර නාශක වාර දෙකක් (2) පමණ යෙදිම.

**වැඩි විස්තර සඳහා**

**ආචාර්ය ආර්. රාජපක්ෂ මහතා**
**පර්යේෂණ නිලධාරී**
**උද්‍යාන බෝග පර්යේෂණ හා**
**සංවර්ධන ආයතනය**
**ගන්නොරුව පේරාදෙණිය.**

**ආචාර්ය ප්‍රදීපා අලහකෝන් මිය.**
**පර්යේෂණ නිලධාරිනී**
**පළතුරු බෝග පර්යේෂණ හා**
**සංවර්ධන ආයතනය**
**හොරණ.**

අධීක්ෂණය හා උපදෙස් ජයන්තා ඉලංකෝන් මිය - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංනිවේදන)

සැකසුම නිලූෂි සිල්වා - කෘෂිකර්ම උපදේශක (සංනිවේදන)